ලේකම්
செயலாளர்
Secretary
දුරකථනය
தொலைபேசி
Telephone
2449959
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය
பொது அலுவலகம்
General Office
දුරකථනය
தொலைபேசி
Telephone
2323022
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2320785

Web Site: www.moj.gov.lk

අධිකරණ අමාත්‍යාංශය

நீதி அமைச்சு

MINISTRY OF JUSTICE

ටෙලිමේල්
Tele
ரெலிமெயில்
අධිකරණ ලේකම්
நீதிச்செயலாளர்
Secminjust

තැ. පෙ.
தபால்பெட்டி
P.O. Box.
555

ඉලෙක්ට්‍රෝනික තැපැල
மின்அஞ்சல்
E-mail
info@moj.gov.lk

උසස් අධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது. இல.
Your No.

දිනය
திகதி
Date
2021.06.08

චක්‍රලේඛ අංක - MOJ/SEC/01

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින්,

සියලුම අධිකරණ වෙත,

**<u>කොවිඩ් -19 සංවරණ සීමා කාලසීමාව තුල අධිකරණ රාජකාරීන් අඛණ්ඩව පවත්නාගෙන යාම පෞද්ගලික ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් ගෙවීම් කිරිම.</u>**

රට තුළ පවතින කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ ද, දිවයින පුරා පිහිටි අධිකරණ වල රාජකාරීන් අඛණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍ය බැවින් ද, පොදු ප්‍රවාහන පහසුකම් ක්‍රියාත්මක නොවන බැවින් ද, එම අත්‍යවශ්‍ය රාජකාරීන් සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට යටත්ව සීමිත නිලධාරීන් පිරිසක් කැඳවිය යුතුව ඇත. එසේ නිලධාරීන් කැඳවීමේ දී, පොදු ප්‍රවාහන පහසුකම් යථා තත්ත්වයට පත්වන තෙක් හෝ විකල්ප ප්‍රවාහන පහසුකමක් සලසා දෙන තෙක් පහත පරිදි ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමටත්, ඒ සඳහා පහත පරිදි ගෙවීම් කිරීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

1. ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 7 හා 8 වගන්ති වල දැක්වෙන විධිවිධානයන්ට අනුව සැතපුම් කුලිය ලබා ගැනිම සඳහා හිමිකම් ලබන නිලධාරීන් පෞද්ගලික වාහනයකින් හෝ කුලියට ගත් පෞද්ගලික වාහනයකින් සේවයට වාර්තා කිරිමේදි 50 Km දුර සීමාවක් ඇතුලත සැතපුම් කුලිය ගෙවීම. (ඒමට හා යාමට 100 Km උපරිමයකට යටත්ව) පදිංචි/ නේවාසික ස්ථානය හෝ 50 Km යන දෙකෙන් අවම ප්‍රමාණය සැලකිය යුතුය.

2. ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 8:1:2 වගන්ති ප්‍රකාරව රේජිස්ටාර්, නියෝජ්‍ය රේජිස්ටාර්, ගණකාධිකාරි, කාර්මික නිලධාරි යන නිලධාරින්ට 8:2 වගන්තියේ සඳහන් පරිදි මෝටර් රථය සඳහා කිලෝ මීටරයට අදාල ගාස්තු ගෙවීමට අනුමැතිය ලබාදෙමි.

3. තවද මාණ්ඩලික නිලධාරීන් නොවන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ඉහත 1. ඡේදයේ දක්වා ඇති දුර සීමාවන්ට යටත්ව XIV වැනි පරිච්ඡේදයේ 8:2 වගන්තියේ සඳහන් පරිදි යතුරු පැදියක් සඳහා වන දීමනාව ගෙවීමට අනුමත කරනු ලැබේ. එකී දීමනාව ඕනෑම විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් සඳහා ගෙවීමට ද අනුමැතිය දෙමි.

4. මෙම අසීරු අවස්ථා වලදී රාජකාරි සඳහා වාර්තා කරන ඔබගේ කාර්යය ප්‍රශංසනීය වන අතර අධිකරණ අමාත්‍යාංශය විසින් ඉතා ඉහළින් අගය කරනු ලබන බැවිද වැඩිදුරටත් සඳහන් කරමි.

මෙම චක්‍රලේඛය 2021 මැයි මස 22 දින සිට බලපැවැත්වෙන බව කාරුණිකව දන්වමි.

**එම්.එම්.පී.කේ.මායාදුන්නෙ**
**ලේකම්**
අධිකරණ අමාත්‍යාංශය

පිටපත් -

1. රජයේ විගණකාධිපති - දැ.ගැ.පි
2. අතිරේක ලේකම් (පාලන), අධිකරණ අමාත්‍යාංශය - දැ.ගැ.පි හා අ.ක.ස
3. ප්‍රධාන ගණකාධිකාරී, අධිකරණ අමාත්‍යාංශය - දැ.ගැ.පි හා අ.ක.ස